[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026**
**General Certificate of Education (Adv. Level) Examination, 2026**

| | | |
|---|---|---|
| ඉස්ලාම් I<br>இஸ்லாம் I<br>Islam I | 44 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>*Two hours* |

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පසුපිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (×) යොදා දක්වන්න.**

**1.** සකාත් ලැබීමට සුදුසු අය අතුරෙන් 'අල්කාරිමූන්' යනුවෙන් හඳුන්වන්නේ,
(1) ණයකාරයන් ය. (2) අන්ත දුගියන් ය.
(3) සකාත් රැස් කරන්නන් ය. (4) මගීන් ය.
(5) වහලුන් ය.

**2.** මලාඉකාවරුන් විශ්වාස කිරීම, ඉස්ලාම් අකීදාවෙහි කීවෙනි අංගය වේ ද?
(1) පළමුවෙනි (2) දෙවෙනි (3) තුන්වෙනි (4) හතරවෙනි (5) පස්වෙනි

**3.** 'නබි මුහම්මද් (සල්) තුමාණන් මුළු මහත් මිනිස් සමාජයටම අයත් කෙනෙකි.' යන්න හැඳින්වෙන පදය වන්නේ,
(1) කාෆ්ෆතුන් ලින්නාස් ය. (2) කාත්තමුන් නබියියීන් ය.
(3) රහ්මතුන් ලිල් ආලමීන් ය. (4) සිරාජුන් මුනීර් ය.
(5) උස්වතුන් හසනා ය.

**4.** පහත ඒවා අතුරෙන් ඉමාම් අහ්මද් ඉබ්නු හන්බල් (රහ්) තුමාගේ පුත්‍රයන් විසින් සම්පාදනය කරන ලද ග්‍රන්ථය වන්නේ,
(1) මසාඉල් සාලිහ් ය. (2) අර්රිසාලා ෆී උසූලිල් ෆික්හ් ය. (3) කිතාබුල් උම්මු ය.
(4) ෆික්හුල් අක්බර් ය. (5) අල් මුතවන්නා ය.

**5.** අල් කුර්ආනයේ ආසන්න වශයෙන් කී වතාවක් සලාතය හා සකාතය එකට සම්බන්ධ කර සඳහන් ව තිබේ ද?
(1) 07 (2) 17 (3) 27 (4) 37 (5) 47

**6.** මුඃතසිලාවරුන්ගේ අකීදාවෙහි ඇතුළත් **නොවන්නේ**,
(1) තව්හීද් ය. (2) සාධාරණත්වය ය.
(3) අවස්ථා දෙකකට අතරමැදි අවස්ථාව ය. (4) ඉස්මත් ය.
(5) පොරොන්දුව හා දඬුවම ය.

**7.** කෙනෙකුගේ මරණයෙන් පසුව ඔහුගේ දේපළ උරුමක්කරුවන්ට බෙදාදීම පිළිබඳ කලාව වන්නේ,
(1) ඉල්මුල් හදීස් ය. (2) ඉල්මුල් මීරාස් ය.
(3) ඉල්මුල් අකීදා ය. (4) ඉල්මුල් ජරහ් වත්තඃදීල් ය.
(5) ඉල්මුත් තෆ්සීර් ය.

**8.** පහත ඒවා අතුරෙන් පිරිමින්ට පැළඳීම තහනම් වන ඇඳුම් පැළඳුම් වන්නේ මොනවා ද?
(1) රත්තරන් හා රිදී (2) කපු ඇඳුම් හා සේද ඇඳුම්
(3) සේද ඇඳුම් සහ රිදී (4) රිදී සහ කපු ඇඳුම්
(5) රත්තරන් හා සේද ඇඳුම්

**9.** තෝරාගන්නා ලද නබිවරුන් කිහිප දෙනෙකුට ලබාදුන් දූතභාවය හැඳින්වූයේ කෙසේ ද?
(1) රිසාලත් ලෙස (2) නුබුව්වත් ලෙස
(3) හිදායත් ලෙස (4) මහබ්බත් ලෙස
(5) මුඃජිසත් ලෙස

[ දෙවැනි පිටුව බලන්න.

Past Papers Wiki



10. කිරුම් මිනුම්වල වංචා සිදු කර අල්ලාහ්ගේ සීමාවන් කඩ කළ 'අයිකා' සමාජය විනාශ කළ බව අල් කුර්ආනය පවසයි. එම සමාජය සඳහා නබි ලෙස එවන ලද්දේ කවුරුන් ද?
(1) ලූත් (අලෙ)
(2) සාලිහ් (අලෙ)
(3) මූසා (අලෙ)
(4) නූහ් (අලෙ)
(5) ෂුඅයිබ් (අලෙ)

11. කෙනෙකු වෙත ගවයින් 40ක් ඇත්තේ නම්, ඔහුට නියම වන සකාත් ප්‍රමාණය වන්නේ,
(1) අවුරුද්දක් සම්පූර්ණ වූ එළුවෙක් ය.
(2) අවුරුදු දෙකක් සම්පූර්ණ වූ එළුවෙක් ය.
(3) අවුරුද්දක් සම්පූර්ණ වූ ගවයෙක් ය.
(4) අවුරුදු දෙකක් සම්පූර්ණ වූ ගවයෙක් ය.
(5) අවුරුදු දෙකක් සම්පූර්ණ වූ ගවයින් දෙදෙනෙක් ය.

12. මකාසිදුෂ් ෂරීආ හි වඩාත් නිවැරදි වර්ගීකරණය වන්නේ,
(1) ලරූරියියාත්, හාජියියාත් සහ තහ්සීනියියාත් ය.
(2) ලරූරියියාත්, තහ්සීනියියාත් සහ ඉබාදාත් ය.
(3) ලරූරියියාත්, හාජියියාත් සහ මුනාකහාත් ය.
(4) හාජියියාත්, ජිනායාත් සහ තහ්සීනියියාත් ය.
(5) තහ්සීනියියාත්, අහ්ලාකියියාත් සහ ජිනායාත් ය.

13. පහත ඒවා අතුරෙන්, 'අහ්ලුස්සුන්නා වල්ජමාආ' පිරිස හැඳින්වීමට යොදාගන්නා පදය වන්නේ,
(1) අහ්ලුල් කිතාබ් ය.
(2) අහ්ලුල් බිදඊ ය.
(3) අහ්ලුර් රඃයි ය.
(4) අහ්ලුල් අතර් ය.
(5) අහ්ලුද් දිම්මා ය.

14. "තරුණයිනි! ඔබලාගෙන් යුග දිවියකට බලසම්පන්න අය විවාහය කරගන්න; මන්දයත් එය බැල්ම පාලනය කරගන්නටත් පතිවත රැකීමටත් යහපත් වේ." යනුවෙන් සඳහන් කළ නබිතුමාණන්, එසේ විවාහයක් කර ගැනීමට බල සම්පන්න නැති අයට පහත සඳහන් කිනම් කාර්යය කරන්නැ'යි අණ කළෙහි ද?
(1) සුන්නත් සලාතවල අවධානය යොමු කිරීම
(2) වැඩි වැඩියෙන් දික්රු කිරීම
(3) ඉඃතිකාෆ් හිඳීම
(4) තාපස දිවියක් ගත කිරීම
(5) සවිමය රැකීම

15. පහත කරුණු අතුරෙන් මිනිසෙකුගේ වාසනාවට අයත් වන ඒවා ලෙස නබිතුමාණන් දැක් වූ කරුණු හතර මොනවා ද?
(1) යහපත් භාර්යාව, යහපත් මිතුරා, යහපත් අසල්වැසියා සහ හොඳ වාහනය
(2) යහපත් භාර්යාව, විශාල නිවස, යහපත් අසල්වැසියා සහ හොඳ වාහනය
(3) යහපත් මිතුරා, විශාල නිවස, හොඳ වාහනය සහ හොඳ ඇඳුම්
(4) විශාල නිවස, යහපත් මිතුරා, හොඳ ඇඳුම් සහ හොඳ වාහනය
(5) හොඳ වාහනය, විශාල නිවස, අලංකාරවත් උද්‍යානය සහ යහපත් භාර්යාව

16. නස්ක් හි වර්ගවල අඩංගු **නොවන්නේ,**
(1) අල් කුර්ආන් වාක්‍යයක් වෙනත් අල් කුර්ආන් වාක්‍යයකින් අහෝසි කිරීමට ලක් කිරීම ය.
(2) අල් කුර්ආන් හි නීතියක් අස්සුන්නාහ් මගින් අහෝසි කිරීමට ලක් කිරීම ය.
(3) සුන්නා හි නීතියක්, සහාබිවරයකුගේ ප්‍රකාශයක් මූලික කොට ගෙන වෙනස් කිරීමට ලක් කිරීම ය.
(4) සුන්නාහ් හි නීතියක් අල් කුර්ආන් මගින් අහෝසි කිරීමට ලක් කිරීම ය.
(5) සුන්නාහ් හි නීතියක් සුන්නාහ් මගින් අහෝසි කිරීමට ලක් කිරීම ය.

17. කෆ්ෆාරා කිරීමේ කොන්දේසිය මත සවිමය අතහැරීමට අවසර ඇත්තේ කාහට ද?
(1) අවශ්‍යතාව මත ගමනෙහි යෙදෙන්නන්ට ය.
(2) මාස් ශුද්ධි අවස්ථාවේ පසුවන කාන්තාවන්ට ය.
(3) වැඩිවියට නොපැමිණි දරුවන්ට ය.
(4) සුවවෙන තත්ත්වයේ පසුවන රෝගීන්ට ය.
(5) සුව නොලැබෙන තත්ත්වයේ පසුවන රෝගීන්ට ය.

18. සහීහ් මුස්ලිම් නම් හදීස් ග්‍රන්ථයෙහි සම්පාදක වන ඉමාම් මුස්ලිම් ඉබ්නු හජ්ජාජ් (රහ්) තුමාණන් උපත ලැබූ වර්ෂය හා ස්ථානය පිළිවෙළින්,
(1) හි. 194 හා බුකාරා ය.
(2) හි. 201 හා සිජිස්තාන් ය.
(3) හි. 204 හා නෛසාපූර් ය.
(4) හි. 209 හා කුරාසාන් ය.
(5) හි. 215 හා නසාඊ ය.

[ තුන්වැනි පිටුව බලන්න.

**19.** කෙනෙකුගේ මරණයෙන් පසුව ද ඔහුට අඛණ්ඩව ආනිසංස ලැබීමට හේතුවන කාර්යයන් ලෙස නබිතුමාණන් ප්‍රකාශ කළ යහපත් ක්‍රියා වන්නේ,
(1) ස්ථාවර දානමාන, ෆර්ල් වූ සව්මය සහ ප්‍රයෝජනවත් අධ්‍යාපනය ය.
(2) ප්‍රයෝජනවත් අධ්‍යාපනය, දෙමව්පියන් වෙනුවෙන් යාච්ඤා කරන සාලිහ් වූ දරුවා සහ ෆර්ල් වූ සලාත් ය.
(3) දෙමව්පියන් වෙනුවෙන් යාච්ඤා කරන සාලිහ් වූ දරුවා, ෆර්ල් වූ සව්මය සහ ෆර්ල් වූ හජ් ය.
(4) ස්ථාවර දානමාන, ප්‍රයෝජනවත් අධ්‍යාපනය සහ දෙමව්පියන් වෙනුවෙන් යාච්ඤා කරන සාලිහ් වූ දරුවා ය.
(5) ෆර්ල් වූ සලාත්, ෆර්ල් වූ සව්මය, ස්ථාවර දානමාන ය.

**20.** ෆික්හ් කලා ඉතිහාසයේ 'මද්රසතු අහ්ලිල් හදිස්' යනුවෙන් හැඳින්වූ කණ්ඩායම ඉස්ලාමීය නීතිරීති විග්‍රහ කිරීමේ දී කුමන කොටසක් ප්‍රමුඛ කරගන්නා ලද්දේ ද?
(1) බුද්ධිය සහ තර්කනය
(2) හදිස් පමණක්
(3) හදිස් සහ බුද්ධියට
(4) හදිස් සහ තර්කනයට
(5) හදිස් සහ ස්වාධීන චින්තනයට

**21.** අල්ලාහ් අනුමත කර ඇති දේවල් අතුරෙන් ඔහු මහත්සේ පිළිකුල් කරන ක්‍රියාව යනුවෙන් හදීසයේ සඳහන් වී ඇති කරුණ වන්නේ,
(1) බහුභාර්යා විවාහයයි. (2) ණය ලබාගැනීමයි. (3) තලාක් කීමයි.
(4) සාක්ෂි කීමයි. (5) සතුන් දබිහ් කිරීමයි.

**22.** ඉස්ලාමීය වෙළෙඳාම් ක්‍රම අතුරෙන් 'අල්බෛඋල් මුඅජ්ජල්' යනුවෙන් අදහස් වන්නේ කුමක් ද?
(1) අතරමැදි වෙළෙඳාම් ක්‍රමය (2) සාමූහික හිමිකාරීත්වය
(3) සේවා ක්ෂේත්‍ර (4) වාරික මුදල් ගනු දෙනු
(5) කෘෂිකාර්මික කොටස් හිමිකාරීත්වය

**23.** ගිවිසුමෙහි සිදු වූ යම් දෝෂයක් හේතුවෙන් විවාහය අවලංගු කිරීමේ ක්‍රමය හඳුන්වන්නේ,
(1) ඊලාඋ ලෙස ය. (2) කුල්උ ලෙස ය. (3) ෆස්කු ලෙස ය. (4) ලිහාර් ලෙස ය. (5) ලිආන් ලෙස ය.

**24.** ඉජ්තිහාදය අනුව ක්‍රියාකිරීමට අවසර ලබා දී, නබිතුමාණන් විසින් යේමන් දේශයට ආණ්ඩුකාරවරයා ලෙස යවන ලද සහාබිවරයා කවුද?
(1) සෛද් බින් තාබිත් (රලි) (2) මුආද් බින් ජබල් (රලි)
(3) මුස්අබ් ඉබ්නු උමෛර් (රලි) (4) අම්රු ඉබ්නුල් ආස් (රලි)
(5) මුහම්මද් ඉබ්නු මස්ලමා (රලි)

**25.** ෆර්උ හි ඇති ඉල්ලත් අස්ල් හි ඇති ඉල්ලතයට වඩා අගයෙන් ඉහළ ව පැවැතීම, කියාස් හි කුමන වර්ගයට අයත් වේ ද?
(1) කියාසුල් අව්ලා (2) කියාසුල් මුසාවි (3) කියාසුල් අද්නා
(4) කියාසුල් ජලි (5) කියාසුල් කෆි

**26.** මරණයට පත්වූ කෙනෙකුට එකම එක ගැහැනු උරුමක්කාරියක් පමණක් සිටින්නේ නම් ඇයට ලැබෙන දේපළ ප්‍රමාණය,
(1) 1/5 කි. (2) 1/4 කි. (3) 1/3 කි. (4) 1/2 කි. (5) මුළු දේපළම වේ.

**27.** පහත ඒවා අතුරෙන්, විවාහ ගිවිසුම සම්මත වීම සඳහා අනිවාර්යයෙන් සලකා බැලිය යුතු අංගයක් වන්නේ,
(1) විවාහයට සම්බන්ධ දෙපාර්ශ්වයම තමන්ගේ තෘප්තිමත් බව ප්‍රකාශ කිරීම ය.
(2) පවුලේ සාමාජිකයන් සහ ඥාතීන් කැඳවා භෝජන සංග්‍රහයක් සංවිධානය කිරීම ය.
(3) විවාහ උත්සවයේ දී මනාල යුවල ද පවුල්වල අය ද විසිතුරු ඇඳුම් පැළඳ සිටීම ය.
(4) විවාහයේ දී විවාහය ලියාපදිංචි කරන්නාගේ ඉදිරිපිට දී මනාලයා ද මනාලිය ද සිය අත්සන් තැබීම ය.
(5) විවාහය තහවුරු කිරීම සඳහා මනාලයා විසින් මනාලියට තැල්ලක් පැළඳවීම ය.

**28.** කෙනෙකුගේ ආධ්‍යාත්මික ජීවිතය පිළිබඳ ඉස්ලාමයේ දැක්ම වන්නේ,
(1) මිනිසා, ශරීරය හා දැනුම සහිත තැනැත්තෙක් ආකාරයට කටයුතු කිරීම වේ.
(2) ජීවිතයේ දී ලෞකික ආශාවන් හා තාපස දිවිය අතර සමතාවය රැකීම වේ.
(3) ශරීරය පීඩාවට පත් කිරීම මගින් ආධ්‍යාත්මික නිදහස ලැබීම වේ.
(4) ජීවත්වීමේ දී නූතන කරුණුවලට මුහුණ නොදී ඉවත්ව සිටීම වේ.
(5) ලෞකික ජීවිතයේ දැඩි ලෙස නිරතවෙමින් එහි ගිලී සිටීම වේ.

[ හතරවැනි පිටුව බලන්න.

Past Papers Wiki



**29.** ඉස්ලාමීය ආර්ථිකයේ නම්‍යශීලි බව විදහා දක්වන රීතියක් වන්නේ,
(1) සම්පත් සියල්ල අල්ලාහ් පනවා ඇති නීතිරීතිවලට අනුව පමණක් මිනිසා විසින් යොදාගත හැකි වේ යන්නයි.
(2) යම් තනි පුද්ගලයෙකුට දේපළ තබා ගැනීමටත් ඒවා වියදම් කිරීමටත් අයිතිවාසිකම ලබා දී ඇත යන්නයි.
(3) කාලීන ආර්ථික තත්ත්ව අනුව, ආර්ථික සැලසුම් සකස් කර ඒවා ක්‍රියාත්මක කළ හැකි ය යන්නයි.
(4) කිහිප දෙනෙකු අතර පමණක් ධනය ඒකරාශි වී සමතුලිත නොවන තත්ත්වයක් ඇතිවීම වළක්වා ඇත යන්නයි.
(5) සුඛෝපභෝගිත්වය සහ අනවශ්‍ය වියදම් කිරීම වළක්වා වියහියදම් සංවිධානය කිරීම අවශ්‍ය වේ යන්නයි.

**30.** ජාහිලිය්‍යා සමයේ සමාජ ව්‍යුහයේ දක්නට තිබූ අසබ්යියා පිළිවෙත කුමක් ද?
(1) කිසිදු කොන්දේසියක් නොමැතිව සියලුම අවස්ථාවල තම ගෝත්‍රයට විශ්වාසවන්තව සිටීම.
(2) දැනුම, ධනය හා පාලන තන්ත්‍ර සහිත අයගෙන් ‘මලඋ’ නම් උසස් සභාව සඳහා පාලකයින් තෝරාගැනීම.
(3) පවුල් එකිනෙක සම්බන්ධ වී, ශාඛා හා ගෝත්‍ර වශයෙන් තමන් බලවත්ත කර ගැනීම.
(4) දැනුම, අත්දැකීම්, වීරත්වය හා ආනුභාවය සහිත කෙනෙක් ගෝත්‍රයේ නායකයා ලෙස තෝරා ගැනීම.
(5) තරගවලින් ජය ලැබීමට හා සතුරන්ගෙන් ආරක්ෂාවීම සඳහා තම ගෝත්‍රයට මිනිස්බලය රැස් කිරීම.

**31.** පහත ඒවා අතුරෙන් ඉස්ලාමීය දැක්මට අනුව ඉපැයීම පිළිබඳ **වැරදි** ප්‍රකාශය කුමක් ද?
(1) නැමදුම් පමණක් නොව රැකියා කටයුතුවල ද නිරත වීම සැබෑ මූඃමින්වරයකුගේ ලක්ෂණය වේ.
(2) ඉපැයීමට ශක්තිය ඇති කෙනෙකු කිසිදු රැකියාවක නොයෙදී සිටීම හරාම් වේ.
(3) කෙනෙකු ලණුවක් ගෙන ගොස් දර එකතු කර රැකියාවක නිරතවීම හිඟමන් යැදීමට වඩා යහපත් වේ.
(4) නිතර නැමදුමේ යෙදෙන්නකු රැකියාවක යෙදීමෙන් මුදා හැර ඇත.
(5) ඉපැයීමට ශක්තිය ඇති කෙනෙකු හට සකාත්වලින් කොටසක් ලබා දීම හලාල් නොවන්නේ ය.

**32.** ජාහිලියියා සමයේ ජනයාගේ විශ්වාස පිළිබඳ පහත පිළිවෙත් අතුරෙන් ඉස්ලාමීය අකීදාවට පටහැනි **නොවන්නේ** කුමක් ද?
(1) ජාහිලියියා සමයේ ජනයා තම දෙවියන් නැමදීම මගින් එම දෙවියන් තමන්ව අල්ලාහ්ට බොහෝ සේ සමීප කරනු ඇතැයි විශ්වාස කළහ.
(2) ඔවුන් පිළිමවලට වන්දනාමාන කළ නමුත් “නුඹලා මැවූ වේ කවුදැ යි” විමසූ විට “අල්ලාහ් ම වේ” යනුවෙන් පිළිතුරු දීමේ පුරුද්දක් ඔවුන් සතුව තිබුණි.
(3) ජාහිලියියා සමයේ ජනයා පිළිම වන්දනාවල නිරත වූ අතර අල්ලාහ් ගේ පැවැත්ම පිළිබඳව ද විශ්වාස කළහ.
(4) ජාහිලියියා සමයේ ජනයා අතර ‘හුනෆා’ ලෙස හැඳින්වූ සමහරුන් ඉබ්රාහිම් (අලෛ) තුමාණන්ගේ ආගම පිළිපැද්දෝ ය.
(5) අල්ලාහ් පිළිබඳ විශ්වාස කළ සමහරුන්, පිළිමවල නම්වලට ඉදිරියෙන් ‘අබ්දු’ යන්න එකතු කර තම දරුවන්ට අබ්දුල් උස්සා වැනි නම් තබා තිබුණි.

**33.** පහත ඒවා අතුරෙන් ඉස්ලාමීය දඬුවම් ඉටු කිරීමට පෙර සැලකිල්ලට ගත යුතු කොන්දේසිවලට අයත් **නොවන්නේ** කුමක් ද?
(1) දඬුවම් ඉටු කිරීමට පෙර, සිදු කළ අපරාධය සාක්ෂි සහිත ඔප්පු විය යුතු බව හෝ චූදිතයා එය තමා කළ බව පිළිගැනීම.
(2) දඬුවම් ලබා දීමට පෙර, අපරාධ සිදුවීම වැළැක්විය හැකි පරිසරයක් සකස් කර තිබීම.
(3) දඬුවම් ලබා දීමට පෙර, එම අපරාධයට පෙළඹූ සාධකය නිසි ලෙස වටහා ගැනීම.
(4) සැකපිට දඬුවම් ලබා දීමෙන් වැළකී සිටීම.
(5) අපරාධ සිදු කරන අයගේ සමාජ තත්ත්වය සැලකිල්ලට ගෙන, දඬුවම් තීරණය කර ඒවා ඉටු කිරීම.

**34.** පහත ඒවා අතුරෙන් සකාත් අරමුදලින් සිදු කළ **නොහැකි** කාර්යය වන්නේ,
(1) ඉපැයීමේ යෙදීමට ශක්තිය තිබෙන දුප්පත් කෙනෙකුට තමාගේ ඉපැයීමට අවශ්‍ය යම් යන්ත්‍රයක් ලබාදීමයි.
(2) වෙළෙඳාමක් කිරීමේ හැකියාව සහිත දුප්පත් අයෙකුට, අවම වශයෙන් ඔහුගේ වෙළෙඳාමට අවශ්‍ය ද්‍රව්‍ය කිහිපයක් හෝ ලබා දීමයි.
(3) දුප්පත් ගොවියකුට, ගොවිතැන් කිරීම සඳහා ඉඩම් කැබැල්ලක් හා ගොවිතැනට අවශ්‍ය ද්‍රව්‍ය ලබා දීමයි.
(4) හජ් වගකීම ඉටු කිරීමට පහසුකම් නොමැති පුද්ගලයකුට, ඒ සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීමයි.
(5) දුප්පත් හා වයෝවෘද්ධ පුද්ගලයකුට, රැකියාවක් කිරීමේ හැකියාවක් නොමැති නම් ඔහුට ස්ථිර වාර්ෂික ආදායමක් සඳහා අවශ්‍ය කටයුතු යෙදීමයි.

**35.** පහත වගුවේ දී ඇති කරුණු සලකන්න.

| | | |
|---|---|---|
| *A* - මුලාරබා | *B* - අත්තෑමීන් | *C* - හිබත් |
| *D* - හදියියා | *E* - වසියියත් | *F* - සලම් |
| *G* - මුරාබහා | *H* - වක්ෆ් | *I* - රිබා |

ඉහත වගුවේ අඩංගු කරුණු අතුරෙන් ධනය බෙදීයාම ක්‍රියාවට නැංවීම සඳහා ඉස්ලාමය පෙන්වා දී ඇති පිළිවෙත් පමණක් අඩංගු වරණය කුමක් ද?

(1) *A, B, C, D* (2) *B, D, E, F* (3) *B, G, H, I,*
(4) *C, A, G, H* (5) *C, D, E, H*

**36.** පහත වගුවේ දී ඇති නම් සලකන්න.

| | | |
|---|---|---|
| *A* - ජන්නතුල් ෆිර්දව්ස් | *B* - සිරාතුල් මුස්තකීම් | *C* - දාරුල් කරාර් |
| *D* - ජන්නතුල් අද්න් | *E* - දාරුල් ජලාල් | *F* - හුතමා |
| *G* - දාරුස් සලාම් | *H* - ජහන්නම් | *I* - ජහීම් |

ඉහත නම් අතුරෙන් ස්වර්ගවල නම් පමණක් අඩංගු වරණය කුමක් ද?

(1) *A, B, C, D, E* (2) *A, C, D, E, G* (3) *B, C, D, G, I*
(4) *C, D, F, H, I* (5) *E, F, G, H, I*

**37.** පහත වගුවේ දී ඇති ඉස්ලාමීය නීති මූලාශ්‍ර සලකන්න.

| | | |
|---|---|---|
| *A* - අල් කුර්ආන් | *B* - අස්සුන්නා | *C* - අල් ඉජ්මාඋ |
| *D* - ඉස්තිහ්සාන් | *E* - සහාබාවරුන්ගේ අදහස් | *F* - පෙර නබිවරුන්ගේ ෂරීආ |
| *G* - ඉස්තිස්හාබ් | *H* - අල් උර්ෆු | *I* - මදීනා වැසියන්ගේ පිළිවෙත් |

මේවායින් ඉමාම් ෂාෆිඊ (රහ්) තුමාණන් අනුගමනය කළ නීති මූලාශ්‍ර පමණක් අඩංගු වරණය කුමක් ද?

(1) *A, B, C, D, E* (2) *A, B, C, E, G* (3) *B, C, D, E, F*
(4) *B, D, E, F, G* (5) *C, D, E, G, H*

**38.** පහත ප්‍රකාශ සලකන්න.

*A* - ඉස්ලාම් සියලුම කාලවලට සුදුසු බව සනාථ කිරීමට උපකාරී වේ.
*B* - නීති විශාරදයකු බිහිවීමට උපකාරී වේ.
*C* - මුස්ලිම් සමාජය මුහුණදෙන දැනුමට අදාළ අභියෝග ජය ගැනීමට උපකාරී වේ.
*D* - ජනයා අතර ඉස්ලාමය ව්‍යාප්ත කිරීමට උපකාරී වේ.
*E* - සිතීමේ නිදහසට ඉස්ලාමය ලබා දී ඇති වැදගත්කම ගෙනහැර දක්වයි.

ඉහත ප්‍රකාශ අතුරෙන් ඉජ්තිහාද් හි ප්‍රයෝජන පමණක් අඩංගු වරණය කුමක් ද?

(1) *A, B, C* (2) *A, B, E* (3) *A, C, E* (4) *B, C, D* (5) *B, C, E*

**39.** පහත කරුණු සලකන්න.

*A* - ඉස්ලාමයට විරුද්ධ කුමන්ත්‍රණ
*B* - උස්මානිය කිලාෆතයෙහි බිඳ වැටීම
*C* - සහාබිවරුන් අතර ඇති වූ දේශපාලනමය බෙදීම්
*D* - අල් කුර්ආන් හා සුන්නා විෂයයෙහි ප්‍රමාණවත් දැනුමක් නොමැති වීම
*E* - මුස්ලිම් රටවල් අතර ඇති වූ මතභේද
*F* - සෙසු සංස්කෘතිවල බලපෑම

ඉහත ඒවායින් ඉස්ලාමීය ඉතිහාසයේ අකීදාවට පටහැනි විවිධ කොටස් බිහිවීමට හේතු වූ සාධක පමණක් අඩංගු වරණය කුමක් ද?

(1) *A, B, C, D* (2) *A, B, C, E* (3) *A, C, D, F* (4) *B, C, D, E* (5) *C, D, E, F*

**40.** පහත ප්‍රකාශ සලකන්න.

*A* - කෙනෙකු තමා කැමැති දෙයකට අකමැති යැයි පැවසුවේ නම් එය බොරු කීමක් යැයි සලකනු නොලැබේ.
*B* - සුළු සුළු කරුණුවල දී බොරු කීමෙන් වැළැකී සිටිය යුතු නොවේ.
*C* - වාදයක දී අවශ්‍ය වුවහොත් බොරු කිහිපයක් යොදාගත හැකි ය.
*D* - සුළු බොරුවක් පැවසුව ද එය සුළු බොරුවක් ලෙස පරලෝ ලේඛනයේ සටහන් කර තබනු ලැබේ.
*E* - මිනිස් ජීවිතයේ දී බොරුකීම මහා පාපයන්ට අයත් වේ.

මේවායින් මුස්ලිම්වරයෙකු බොරු කීමට අදාළව ඉස්ලාමයේ ස්ථාවරය දක්වන නිවැරදි ප්‍රකාශ පමණක් අඩංගු වරණය තෝරන්න.

(1) *A, B* (2) *B, C* (3) *B, D* (4) *C, D* (5) *D, E*

**41.** පහත කරුණු සලකන්න.

*A* - අබ්බාසිය පාලන සමයේ දී, දැනුම් ක්ෂේත්‍රයට මෙන් අධ්‍යාත්මික ක්ෂේත්‍රයට වැදගත්කමක් නොදැක්වීම හේතුවෙන් මුස්ලිම්වරුන් අතර එම ක්ෂේත්‍රය බිඳ වැටී පැවතුණි.

*B* - ආධ්‍යාත්මික ක්ෂේත්‍රයේ ගැඹුරින් නියැළී සිටි සූෆි විද්වතුන්, ඉස්ලාමය විනාශ කිරීමට උත්සාහ කළ මොන්ගෝලියානුවන්ව ඉස්ලාමය වැළඳ ගැනීමට යොමු කළහ.

*C* - ජනයා ආධ්‍යාත්මික මාර්ගයට යොමු කිරීමේ අරමුණින් ෂෙයිහු අබ්දුල් කාදිර් ජීලානි තුමාණන්ගේ පුහුණු මාර්ගය ඔස්සේ කාදිරියියා තරීක්කාව බිහි විය.

*D* - තමන්ගෙන් බෛඅත් ලබාගත් අය, අල් කුර්ආන් හා සුන්නාවල ආලෝකයෙන් ආධ්‍යාත්මික දියුණුවට යොමු කිරීමේ කාර්යය සූෆි විද්වතුන් ඉටු කළහ.

*E* - ඉතිහාසය පුරා, බටහිර අධිරාජ්‍යවාදීන් සූෆි තරීක්කාවන් කෙලෙසීමේ අරමුණින් ඒවායෙහි රහසින් ඇතුළු වී විවිධ තරීක්කා අතර ගැටුම් ඇති කළහ.

මේවා අතුරෙන්, ඉතිහාසය අනුව ඉස්ලාමයේ දියුණුවට සූෆි විද්වතුන්ගේ දායකත්වය විදහා දක්වන ප්‍රකාශ පමණක් අඩංගු වරණය කුමක් ද?

(1) *A, B, C* (2) *A, B, D* (3) *B, C, D* (4) *B, C, E* (5) *C, D, E*

**42.** මක්කි හා මදනි වාක්‍යවල සුවිශේෂී ලක්ෂණ පහත ලයිස්තු ගත කර ඇත.

*A* - “ඕ... මිනිසුනි” යනුවෙන් අමතන ප්‍රවණතාව

*B* - සමාජ ආරක්ෂාව සහතික කිරීම

*C* - මුනාෆික්වරුන්ගේ ලක්ෂණ පිළිබඳව පැහැදිලි කිරීම

*D* - ආකර්ෂණීය වචන, කුඩා ආයත්, කුඩා පරිච්ඡේද

*E* - ‘හුරූෆුල් මුකත්තආත්’ යෙදුම සූරා ආරම්භයේ යෙදී තිබීම

*F* - දීර්ඝ වාක්‍යය, දීර්ඝ පරිච්ඡේද

ඉහත ඒවා අතුරෙන් මක්කි වාක්‍යවල සුවිශේෂී අංග පමණක් දක්වන වරණය කුමක් ද?

(1) *A, B, C* (2) *A, D, E* (3) *B, C, F* (4) *B, D, E* (5) *D, E, F*

- අංක **43** සිට **45** දක්වා වූ සෑම ප්‍රශ්නයකට ම **X** සහ **Y** යන තීරු යටතේ තොරතුරු ලබා දී ඇත. **X** තීරුවේ ඇති තොරතුරු **Y** තීරුවේ ඇති තොරතුරු සමග කිසියම් හෝ ආකාරයකට සම්බන්ධ වේ. එහෙත් ඒවා අනුපිළිවෙළින් නොපවතී. ඒ අනුව **X** තීරුවේ දී ඇති පිළිවෙළට **Y** තීරුවේ ඇති තොරතුරු ගැළපෙන පරිදි නිවැරදිව අනුපිළිවෙළට සැකසීමේ දී ලැබෙන පිළිතුර තෝරන්න.

**43.**

| X | Y |
|---|---|
| (i) කවාරිජ් | *A* - ආගමෙන් වේගයෙන් පිටමං වූ අය |
| (ii) ඉස්නා අසරියියා | *B* - තම බුද්ධිමය න්‍යාය හේතුවෙන් වෙන්වී ගිය අය |
| (iii) අල් මාරිකා | *C* - නායකයාගේ පාලනයෙන් මිදී පිටමං වූ අය |
| (iv) මුඃතසිලා | *D* - මිනිසාට කිසිම කාර්යයක් කිරීමේ නිදහසක් නැතැයි පවසන අය |
| (v) ජබරියියා | *E* - ඉමාම්වරුන්ගේ සංඛ්‍යාව දොළහක් බව විශ්වාස කරන අය |

(1) *A, B, C, D, E* (2) *A, C, D, E, B* (3) *B, C, D, E, A*
(4) *C, A, B, E, D* (5) *C, E, A, B, D*

**44.**

| X | Y |
|---|---|
| (i) මර්ෆූඃ | *A* - හදීසයක් තාබිඊ තෙක් ගොස් ඔහු වෙතින් නතර වීම |
| (ii) මව්කූෆ් | *B* - ඉස්නාද් වැලෙහි බිඳීමකින් තොරව, අඛණ්ඩව නබි (සල්)තුමා තෙක් ගොස් සම්බන්ධ වන හදීස් |
| (iii) මුර්සල් | *C* - හදීසයක ඉස්නාද් සහාබි තෙක් පමණක් අඛණ්ඩව යාම |
| (iv) මුඅල්ලක් | *D* - හදීසයක වැලෙහි සහාබිවරයා අතහැර, තාබිඊ කෙනෙකු සෘජුව නබි (සල්) තුමා වෙතින් දැනුම් දෙන හදීසය |
| (v) මක්තූඃ | *E* - ඉස්නාදයක ආරම්භයේ දී එක් අයෙකු හෝ ඊට වැඩි දැනුම් දෙන්නන් හෝ අත්හැරීම |

(1) *A, B, C, D, E* (2) *A, C, D, E, B* (3) *B, C, D, E, A*
(4) *B, D, E, A, C* (5) *C, D, A, E, B*

**45.**

| X | Y |
|---|---|
| (i) අල් ඉජාරා | *A* - වෙළෙඳ ගිවිසුමෙහි භාරදීම සහ පිළිගැනීම |
| (ii) අර් රහ්න් | *B* - අවශ්‍යතාවල දී ණය ලබා ගැනීම |
| (iii) අල් කර්ල් | *C* - භාණ්ඩ හා සේවා කුලියට ලබා ගැනීම |
| (iv) වකාලා | *D* - ලබාගත් ණය පියවන තෙක් වටිනා දෙයක් උකසට තැබීම |
| (v) ඊජාබ්-කබූල් | *E* - තමා වෙනුවෙන් වගවීමට වෙනත් කෙනෙකු නම් කිරීම |

(1) *A, B, C, D, E* (2) *B, C, D, E, A* (3) *B, D, E, A, C*
(4) *C, D, B, E, A* (5) *C, E, A, B, D*

- අංක **46** සිට **50** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්න අංකයට අදාළ ව දී ඇති ප්‍රකාශ යුගලය සම්බන්ධයෙන් පහත සඳහන් (1), (2), (3), (4), (5) යන වරණවලින් වඩාත් ගැළපෙන යුගලය සහිත වරණය තෝරා එහි අංකය පිළිතුරු පත්‍රයේ සලකුණු කරන්න.

| අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| (1) | නිවැරදි ය. | නිවැරදි ය. |
| (2) | වැරදි ය. | නිවැරදි ය. |
| (3) | නිවැරදි ය. | වැරදි ය. |
| (4) | වැරදි ය. | වැරදි ය. |
| (5) | නිවැරදි ය. | නිවැරදි වන අතර පළමුවන ප්‍රකාශය තවදුරටත් විස්තර කරයි. |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| **46.** | යම් අයහපතක් සිදුවන බව දුටුවහොත්, එය තම අතින් හෝ මුවෙන් වැළැක්වීමට හැකියාව තිබුණ ද, සිතින් එය පිළිකුල් කර ඉවත්ව යාම ඉස්ලාමය පෙන්වා දී ඇති පිළිවෙත වේ. | යමෙකුට පිළිකුල ඇති කරන නම් පටබැඳීම මුස්ලිම්වරයකුගේ අයහපත් ගතිගුණවලට අයත් බව සැලකෙන අතර, එසේ කරන්නා අයුක්තිවන්තයෙකු ලෙස ද හැඳින්වේ. |
| **47.** | යමෙකු අතුරුදහන් වී දීර්ඝකාලයකින් පසුවත් ආපසු නොපැමිණියේ නම් විනිශ්චයකරුගේ තීන්දුව මත ඔහුගේ දේපළ, උරුමක්කරුවන්ගේ දේපළ ලෙස සැලකේ. | අල් කුර්ආන් හා සුන්නා මගින් කොටස් ඉතා පැහැදිලිව දක්වා ඇති උරුමක්කරුවන් අස්හාබුල් ෆුරූල් යැයි හැඳින්වේ. |
| **48.** | ජන වර්ග, භාෂා වැනි මිනිසුන් අතර පවතින වෙනස්කම් දේව නිර්ණයවල ඇති බවට අල් කුර්ආනයේ ඉගැන්වීම සෑම මුස්ලිම්වරයකුම පිළිගත යුතු ය. | මිනිසුන් අතර පවතින ආගම් හා සමාජමය වෙනස්කම් අල්ලාහ්ගේ සැකැස්ම බව සිතෙන් පිළිගෙන, අනෙකුත් ආගම්වල හා ඒවා පිළිපදින්නන්ගේ පැවැත්ම අනුමත කිරීම සෑම මුස්ලිම්වරයකුගේම වගකීමකි. |
| **49.** | නබි (සල්) තුමාණන් මදීනාවෙහි ඉස්ලාමීය සමාජයක් ගොඩනැගීම සඳහා අවුරුදු දහයක පමණ කාලයක් සැලසුම් සහගතව කටයුතු කළේ ය. | මුස්ලිම් නොවන්නන් සමග හතුරු වී ඇති විට දී ඔවුන් සමග යුක්තිසහගතව කටයුතු කළ යුතු බවට ඉස්ලාමය මුස්ලිම්වරුන්ට අවධාරණය නොකරයි. |
| **50.** | ලංකාව හරහා යන මුහුදු වෙළෙඳ මාර්ග පිළිබඳ පරිචයක් නොතිබීම හේතුවෙන් අනුරාධපුර පාලන සමයේ මුස්ලිම්වරුන් වෙළෙඳාමෙහි දායක නොවූහ. | ලංකා ඉතිහාසයේ පෘතුගීසින්, ලන්දේසින් වැන්නන්ගේ කරදරවලට පාත්‍ර වූ මුස්ලිම්වරුන් මහනුවර රාජධානිය වෙත ගියද එහි සිටි සිංහල රජවරුන් ඔවුන්ට උදව් නොකළහ. |

* * *

Past Papers Wiki



AL/2026/44/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

| | |
|---|---|
| ඉස්ලාම් | II |
| இஸ்லாம் | II |
| Islam | II |

**44 S II**

*පැය තුනයි*
*மூன்று மணித்தியாலம்*
*Three hours*

| | | |
|---|---|---|
| අමතර කියවීම් කාලය | - | මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| Additional Reading Time | - | 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

※ **I කොටසින්** ප්‍රශ්න **දෙකක්** ද, **II කොටසින්** ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** (i) 'ෆික්හ්' යන්න නිර්වචනය කරන්න. (ලකුණු 02යි)

(ii) 'ෆර්ලු අයින්' සහ 'ෆර්ලු කිෆායා' යන **දෙක** වෙන වෙනම පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iii) හිජ්රි දෙවන ශතවර්ෂයේ ආරම්භයේ සිට හතර වන ශතවර්ෂයේ මැද භාගය තෙක් වූ කාලය ෆික්හ් කලාවේ ස්වර්ණමය යුගය වශයෙන් හැඳින්වීමට හේතු **තුනක්** සඳහන් කර, ඒවා පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

(iv) ඉස්ලාමීය නීති ක්ෂේත්‍රයේ විද්වතුන් අතර මතභේද ඇති වීමට පාදක වූ හේතු **හතරක්** සඳහන් කර, ඒවා පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

**2.** (i) මලාඉකාවරුන්ගේ කාර්යභාරයන් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ii) උරුමක්කාර දේපළවල කොටස් ලබා ගැනීම තහනම් කරන සාධක **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iii) අධ්‍යාත්මික දියුණුවට අදාළ පිළිවෙත් **තුනක්** සඳහන් කර ඒවා පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

(iv) ඉස්ලාමීය ආර්ථික ක්‍රමයේ සුවිශේෂී අංග **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

**3.** (i) විනිශ්චය දිනය හඳුන්වන වෙනත් නම් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ii) නබි (සල්) තුමාට හිමි යැයි ඉස්ලාමීය විද්වතුන් වර්ග කර දක්වා ඇති **ෂෆාඅත් දෙකක්** සඳහන් කර ඒවා පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iii) ලෝකාවසානයේ මහා ලක්ෂණ **තුනක්** සඳහන් කර ඒවා පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

(iv) 'පරලොව ජීවිතය නිශ්චිත වේ' යන්න සාක්ෂි දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

PAST PAPERS WIKI

[ දෙවැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

## II කොටස

**4.** (i) 'ඉද්දා' යන්න නිර්වචනය කර, එහි වර්ග **දෙකක්** සාක්ෂි සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(ii) ආගම පිළිපැදීමෙහිලා මධ්‍යස්ථභාවය අනුගමනය කිරීම පිළිබඳ ඉස්ලාමීය දැක්ම පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

**5.** (i) හජ්හි අරමුණු **පහක්** පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(ii) ප්‍රාණීන්ට හානි නොකළ යුතුය යන්න පිළිබඳ ඉස්ලාමයේ දේශනා විස්තර කරන්න. (ලකුණු 10යි)

**6.** (i) "ඉස්ලාම් දහම පිරිමින්ට මෙන්ම ස්ත්‍රීන්ටද ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව ලබා දී ස්ත්‍රීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරයි." මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(ii) "අපරාධවලට අදාළව ඉස්ලාම් දහම ලබා දී ඇති දඬුවම් සාධාරණීකරණය කළ හැකි ය." යන්න විවේචනාත්මකව විස්තර කරන්න. (ලකුණු 10යි)

**7.** (i) අබූබක්කර් (රලි) තුමාණන් කලීෆා වශයෙන් තෝරා පත්කරන ලද ආකාරය සඳහන් කර, එතුමාණන් කිලාෆතය ස්ථාපිත කිරීමේ දී මුහුණ දුන් අභියෝග සාකච්ඡා කරන්න. (ලකුණු 10යි)

(ii) පෘතුගීසින් හේතුවෙන් ලංකාවේ මුස්ලිම් ජනතාව මුහුණ දුන් ගැටලු සඳහන් කර, එම කාලවකවානුවේ මෙරට රජවරුන් මුස්ලිම්වරුන්ට සහාය දැක්වූ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

**8.** පහත සඳහන් මාතෘකා පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) කාන්තාවන්ට අදාළ ඇඳුම් පිළිබඳ ඉස්ලාමීය නීතිරීති (ලකුණු 05යි)

(ii) ලේ ඥාතීත්වය රැකීමේ අවශ්‍යතාව පිළිබඳ ඉස්ලාමීය දැක්ම (ලකුණු 05යි)

(iii) ජාතික ආරක්ෂාව කෙරෙහි නිදහසට පෙර සිටි ලාංකේය මුස්ලිම්වරුන්ගේ දායකත්වය (ලකුණු 05යි)

(iv) පොදු යහපත රැකීම කෙරෙහි ඉස්ලාම් දහම ලබා දී ඇති වැදගත්කම (ලකුණු 05යි)

* * *

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library